# An Investigative Study of Western and Buddhist Teachings on Human Sexual Abnormalities

## මානව ලිංගික අසාමාන්‍ය චර්යා පිළිබඳ බටහිර හා බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

'ලිංගිකත්වය' යනු මූලික මානව අවශ්‍යතාවක් බව බොහෝ විෂය ක්ෂේත්‍ර තුළ පිළිගැනේ. එහිදී තිරිසන් සතුන්ට සාපේක්ෂකව මානව ලිංගිකත්වය තුළ සුවිශේෂී බවක් දැකගත හැකි ය. නොයෙක් සමාජ සංස්කෘතික විශ්වාස හා සාරධර්ම පද්දතීන් මානව ලිංගිකත්වය වටා දැකගත හැකි අතර ඒවා රටෙන් රටට, ජාතියෙන් ජාතියට, ආගමෙන් ආගමට, සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට විවිධ වේ. මානව ලිංගිකත්වය තුළ දැකගත හැකි අක්‍රමතා රාශියක් පිළිබඳ බටහිර මනෝවිද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇති අතර ඒවා ලිංගික අප්‍රාණිකතා හා පැරෆීලියා අක්‍රමතා යනුවෙන් ප්‍රධාන අවස්ථා දෙකක් යටතේ දක්වයි. මෙහි ලිංගික අප්‍රාණිකතා යනු සාමාන්‍ය ජීවවිද්‍යාත්මක ලිංගික ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටලු ය. පැරෆීලියා අක්‍රමතාව යනු සාමාන්‍ය ලිංගික චර්යාවන්ගෙන් වියුක්තව කිසියම් පුද්ගලයෙකු තුළ විවිධ වස්තූන් හා අවස්ථාවන් කෙරෙහි ඇතිවන දැඩි හා තීව්‍ර ලිංගික ආසාව හෝ මනඃකල්පිතයයි. Diagnostic and Statistical Manual of Mental Disorders - 5 (DSM -5) හි එවැනි අසාමාන්‍ය මානව ලිංගික චර්යා රාශියක් දක්වා ඇත. දර්ශනවාද අක්‍රමතාව (Voyeuristic Disorder), ප්‍රදර්ශන අක්‍රමතාව (Exhibitionistic Disorder), මාර්ජක අක්‍රමතාව (Frotteuristic Disorder), කෞමාර ලිංගික අක්‍රමතාව (Pedophilic Disorder), අර්චනකාම අක්‍රමතාව (Fetishistc Disorder), පාරවේශනත්ව අක්‍රමතාව (Transvestic Disorder), ස්වපීඩා කාමුක අක්‍රමතාව (Sexual Masochism Disoder), පරපීඩා කාමුක අක්‍රමතාව (Sexual Sadism Disorder) ඉන් කිහිපයකි. මීට අමතරව Telephone scatologia, Necrophilia, Zoophilia, Coprophilia, Urophilia, Klismaphilia, Somnophilia, Stigmatophilia, Autonepiophilia යනුවෙන් ද අසාමාන්‍ය ලිංගික චර්යා රාශියක් පිළිබඳ මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ සාකච්ඡා වේ. බෞද්ධ ධර්ම ග්‍රන්ථ සාහිත්‍යය අධ්‍යයනයේ දී ද උක්ත පැරෆීලියා අක්‍රමතාවන්ට සමාන වූ මානව ලිංගික අසාමාන්‍ය චර්යා රාශියක් පිළිබඳ තොරතුරු සොයාගත හැක. කාමෝන්මාද හා කාමමිථ්‍යාචාරය (දරිමුඛ ජාතකය, නකුල ජාතකය, තක්ක ජාතකය, චුල්ලපලෝභන ජාතකය, දුරාපන ජාතකය, අනභිරති ජාතකය, බන්ධන මොක්ඛ ජාතකය, අන්ධභූත ජාතකය). විරූපි හෝ විකලාංග සහිත පුද්ගලයන් හා සංවාසය (කුණාල ජාතකය, චුල්ලපදුම ජාතකය). ළාබාලයන් කෙරෙහි ලිංගික රුචිකත්වය (මහා පදුම ජාතකය, අසාතමත්ත ජාතකය, අන්ධභූත ජාතකය, චුල්ලනාරද ජාතකය). ලේ ඥාතීන් අතර ලිංගික චර්යාව (මහා පදුම ජාතකය, සෙන්ගු ජාතකය, පණ්ණික ජාතකය). දර්ශාස්වාද/මළපහ සමඟ ලිංගික රුචිකත්වය (බාහිය ජාතකය). ලිංගික ඊර්ෂ්‍යාව පිළිබඳ අක්‍රමතා (චුල්ල ධර්මපාල ජාතකය, චුල්ලපලෝභන ජාතකය). සතුන් සමඟ ලිංගිකව හැසිරීම (විනය පිටකය). මෙම බෞද්ධ ධර්ම සාහිත්‍යාගත අවප්‍රමාණ මානව ලිංගික චර්යාවන් බටහිර මනෝවිද්‍යාත්මක කරුණු හා සන්සන්දනාත්මකව අධ්‍යයනය කිරීම මෙන්ම ඒ සඳහා උපයෝගී කොටගත හැකි ප්‍රතිකාර විමසීම මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් අපේක්ෂිත ය.

ප්‍රමුඛ පදඃ මානව ලිංගිකත්වය, අසාමාන්‍ය චර්යා, ලිංගික ගැටලු, උපදේශනය, ප්‍රතිකාර.